00062

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන- 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018/2019

**ESD2230/EPD4530** ළමා සංවර්ධනය II

කාලය - පැය තුන (03) යි.

---

දිනය - 2020.09.26 වන දින | වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලු ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.

1 වන කොටස

01. නියුරෝන වර්ග තුනක් (03) නම් කර එක් නියුරෝන වර්ගයක කාර්යභාරය පැහැදිලි කරන්න.

02. පිටියුටරි ග්‍රන්ථියේ කාර්යභාරය පැහැදිලි කරන්න.

03. ශිෂ්‍යයකු තුළ 'සංජානනය' සිදුවන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

04. 'නිරීක්ෂණාත්මක ඉගෙනුම' යන පදය පැහැදිලි කරන්න.

05. උත්තේජකයක තීව්‍රතාවය අවධානය කෙරෙහි බලපාන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

06. ෆ්‍රොයිඩ්ට අනුව පෞරුෂයේ ප්‍රධාන කොටස් තුනෙහි (03) අන්තර් සම්බන්ධතාව විස්තර කරන්න.

07. ඔබ ගුරුවරයෙකු ලෙස සිසුන්ට ධනාත්මක උපස්ථම්භන ලබා දෙන ආකාරය උදාහරණයක් මගින් පෙන්වා දෙන්න.

08. ඔබ ගුරුවරයෙකු ලෙස ආසන්නතාවය මූලධර්මය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කරන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09\. (i) ශිෂ්‍යයින්ගේ අවධානයට බලපාන බාහිර සාධක පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) අවධානය ශිෂ්‍යයෙකුගේ ඉගෙනුම් ක්‍රියාවලියට බලපාන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10\. (i) පෞරුෂ වර්ග හා පෞරුෂ ගති ලක්ෂණ න්‍යායන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ගුරුවරයෙකු ලෙස පෞරුෂ වර්ග හා පෞරුෂ ගති ලක්ෂණ පිළිබඳ ව ඔබ තුළ ඇති අවබෝධය ඉගෙනුම් ක්‍රියාවලිය සුසාධ්‍යකරණයට භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

11\. (i) ප්‍රාථමික පාසල් සිසුන්ට ඉගැන්වීමට ඔබ භාවිත කිරීමට කැමති චර්යා අනුවර්තන ක්‍රමයක් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) ඔබ විසින් දක්වන ලද චර්යා අනුවර්තන ක්‍රමයෙහි මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඔබ විසින් තෝරා ගත් චර්යා අනුවර්තන ක්‍රමයට අදාළ ව දරුවන්ගේ ඉගෙනුම සුසාධ්‍යකරණය සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරියක වශයෙන් ඔබගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

12\. (i) වෙන්වීමේ කාංසා අක්‍රමිකතාවය යනු කුමක් ද? (ලකුණු 04)

(ii) වෙන්වීමේ කාංසා අක්‍රමිකතාවයෙන් පෙළෙන ළමයෙකුගේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) වෙන්වීමේ කාංසා අක්‍රමිකතාවයෙන් පෙළෙන ළමයෙකු එම තත්ත්වයෙන් මුදවා ගැනීමට ගුරුවරයෙකු වශයෙන් ඔබ ගන්නා ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 10)

13\. (i) සිසුන් තුළ මනෝවිද්‍යාත්මක අක්‍රමතා සංවර්ධනයවීම සඳහා පවුල් පරිසරය බලපාන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සිසුන් තුළ මනෝවිද්‍යාත්මක අක්‍රමතා අවම කිරීමට මවක/පියෙකු ලෙස ඔබ ක්‍රියාකරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම ඇවිරිණි.